


# ශ්‍රී ලංකා මාතා

"රත්තරං අම්මා බුදු වේවා !" ලංකාවට ගිය වෙලාවෙ පින්සලට හිතුණා පච්චයක් කොටාගත්තොත් හොඳාය කියලා. ඔය කිව්ව ප්‍රාර්ථනය ත්‍රී වීලර් එකක පිටිපස්සේ ලියලා තියෙනවා දැකලයි පින්ට ඔය සිතුවිල්ල පහළ වුණේ. මරදානේ මරියකඩේ පැත්තේ පච්ච සෝමෙව හොයාගෙන පින් ගියේ පන්හිඳත් එක්ක.

"මට ඕනෑ "රත්තරං අම්මා බුදුවේවා !" කියලා තනි පේළියට කොටාගන්න....." පින් පච්ච සෝමෙට කිව්වා.

"අරි අරි ඉතිං ! ඔය කමිසෙ ගැලෙව්වනං බලන්න බොස්..." ඒ පච්ච සෝමෙ. පින් කමිසෙ ගැලෙව්වා.

ආ....පෝ.... බොස්; බොස්ගෙ පපුවෙ හැටියට ඕනනං "හොඳ හිත !" දෙපේළියට කොටලා දෙන්නං...." ඔන්න පින්ගෙ පපුවේ දිග පළල ! පින් කැමති වුණා. මොකද තමුන්ගේ හිත හොඳ බව කාටත් පෙන්නන්න පුළුවන් හන්දා.

"හොඳ

හිත !"

පච්චෙ කෙටුවට මොකද ඉඩ මදි හන්දම විශ්මයාර්ත ලකුණ තුන්වෙනි පේළියට ගියා. විශ්මයාර්තෙ තිත පෙකණියට එන විදියට තිව්වා. පච්ච නො කොටා ආවොත් සෝමෙගෙන් ගැලවිලා ඉන්නයැ ? ඔන්න ඔහොමයි එහෙ වැඩ.

"ලංකාවට ගිහිං ආවම හැමෝම අහන්නේ " කොහොමද දැං ලංකාව ?" කියලයි." පන් කිව්වෙ හැඟීම් බරව.

"කවුද අකමැති තමුන්නේ රටේ තොටේ තොරතුරු දැනගන්න ?"

පින් උත්තර බැන්දා. "තමුන්ට දැනුණ දෙයක් ඇත්තං ලියන එකනෙ ඇත්තෙ." පින් පච්චය කොහොමද කියලා කන්නාඩියෙන් බලන ගමන් කිව්වා.

"මේ යකා අකුරු ටික අනික් අතට නේද කොටලා තියෙන්නෙ..." පින්ට කන්නාඩිය දැකලා යකා නැගලා.

"නෑ නෑ හලෝ ! ඔය කන්නාඩියෙන් පේන හැටි !!"

පන් ලියන මේසෙ දිහාවට ගියේ "මහ ලොකු පණ්ඩිතයා... ඒකවත් දන්නේ නෑ..." කියලා මුමුණන ගමන්.

"ලංකාවේ ගියහම බය නැද්ද ?" එක බලවතෙක් පන්ගෙන් අහපු හැටි පන්ට මතක් වුණා.

"ආරක්ෂක තත්වය කුමක් වුව ද එදිනෙදා ජීවන කටයුතු නතර කිරීමට හැකිවන්නේ කවුරුන් හට ද? රැකියාවන් සඳහා යා යුතුමය. අධ්‍යාපන කටයුතු සඳහා යාමට මඟට බැසිය යුතුමය. දෙපා මුල අනතුරක් ඇති බව පෙනි පෙනී වුව ද කිසිවකුට සිය දෛනික කටයුතු වලින් බැහැර විය නොහේ. එසේ වුව ද පෙර වතාවලට වඩා වැඩි අවධානයකින් සියළු දෙනාම පසුවන වගනම් මොනවට පෙනිණ. ගමන් මල්ලක් හෝ බෑගයක් ගෙන බසයකට ගොඩවන්නකු දෙස විමසුම් ඇස් යොමු වීම සුලභ දෙයක් විය. ගමන් මලු තැබීම සඳහා බස් රථවල ඇති රාක්ක මත මලු තැබීම ඇතැම් පෞද්ගලික බස් රථවල තහනම් කොට ඇත්තේය. ගමන් මලු තමන් වෙත ම තබා ගත යුතු වේ. එහි තැබුවද විටින් විට කොන්දොස්තරවරයා විසින් එලෙස තැබු ගමන් මලු වල අයිතිකරුවන් සොයා බැලූ අවස්ථා විය. අයිතිකරුවකු නොමැති බෑගයක් නිසාවෙන් බසය පාර මැද නවතා මඟීහු මතු නොවන පාරේ ගමන් ගත් පදිකයින් පවා සී සී කඩ දිවූ අවස්ථාවකට බොරැල්ලේ දී මුහුණ පෑවෙමු අපි...." පන් ලියාගෙන ගියා.

කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පැවති ත්‍රස්වාදීන්ගේ දිගු නිහැඬියාව බිඳී ගියේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිවරයාගේ ඛේදවාචකයත් සමඟිනි.

කොළඹ නගරයේ වාහන තදබදය අවම කරගැනීමෙහි ලා උත්සුක වන බලධාරීන් මාර්ග ගණනාවක්ම එක අතට වාහන දිවෙන මාර්ග වශයෙන් නම් කොට තිබීම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමත් වන්නේය. ගාළු පාර පසුගිය වසරේ ද එලෙස නම් කොට තිබුණ අතර ඊට එක් වුණ තවත් එක් මාර්ගයක් ලෙසට තුන්මුල්ල හන්දියේ සිට කුරුඳුවත්ත පොලීසිය ඉදිරියෙන් දිවෙන රීඩ් මාවත දැක්විය හැකිය. අළුතින් විදුලි සංඥා එළි ඉදි කෙරුණා වූ මංසන්ධිවලින් එකකි බොරැල්ලේ කාසල් වීදියේ දේවි බාලිකාව අසල වට රවුම. කොළ එළියේ සිට රතු එළිය දක්වාත් රතු එළියේ සිට කොළ එළිය දක්වාත් පහළට ගණන් කිරීමේ :ඤදමබළු ාදඅබ* අමතර විදුලි සංඥා ලාම්පු ද ඊට බද්ධ කර තිබීම මෙරට පවා දක්නට නොලැබෙන්නකි. මෙවන් මංසන්ධි ගණනාවක් ඇති බැව් දැකගන්නට ලැබිණ. දින හැටක් වැනි ඉතාම කෙටි කාලයකින් කැළණියේ ඉදිකරන ලද පියාසර පාලම :තකහ දඩැර ඉරසාටැ* තවත් එවැන් පාලම් ගණනාවක් සඳහා තබන ලද මුල් පියවරයි. දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු ද කඩිනමින් කෙරීගෙන යන අතර එකී මාර්ගය කොට්ටාව මාකුඹුර ප්‍රදේශයේ සිට කඩුවෙල ප්‍රදේශය හරහා වත්තල ප්‍රදේශයේ දී මීගමුව මාර්ගයට සම්බන්ධ කෙරෙන පිට වටරවුම් පාර සඳහා ඉඩම් අත්පත් කර ගැනීමටත් ගොඩනැගිලි ඉවත් කිරීමත් මේ වනවිට ඇරඹී ඇත්තේය. කඩුවෙල සිට මාලඹේ දක්වා මාර්ගයේ මාර්ග තලය පුළුල් කිරීම එකී මාර්ගයට දැරිය නොහැකි තරමේ තදබදයට සහනයක් වනු ඇත. ලංකා ගමනා ගමන මණ්ඩලය නැවත ස්ථාපිත කිරීමත් නව බස් රථ දෙසීයයක් පමණ ධාවනය සඳහා යෙදවීමත් මහජනයාගේ හිත සුව පිණිස කෙරුණා වූ තවත් එක් සද්කාර්යයකි. එහෙත් එක් බස් රථයකින් යැපෙන්නා වූ සේවක සංඛ්‍යාව මේ වන විටත් අට දෙනෙක් පමණ වන බැව් අසන්නට ලැබිණ. මුළු රට පුරා පැතිර ඇති ත්‍රී රෝද වසංගත අද ඇතිවත් බැරි නැතිවත් බැරි තත්වයකට පත් වී ඇත්තේය. ලංගම බසයක අවම ගමන් ගාස්තුව රුපියල් හයක් වන විට ත්‍රී රෝද රියක අවම ගාස්තුව රුපියල් හැටකි. එහෙත් මගීන්ට ඊට ඇබ්බැහි වන්නට සිදුවන්නේ වාහන තදබදයට එය එක්තරා අන්දමකට පිළියමක් වන බැවිනි. එහෙත් පොදුවේ ගත් කළ එය වාහන තදබදය උත්සන්න කරවන්නක් වන්නේය.

බනිස් ගෙඩියක් හා තේ කෝප්පයක් සඳහා සාමාන්‍යයෙන් රුපියල් 50ක් පමණවත් වියදම් කළ යුතු වන්නේය. සහල් කිලෝවක මිල රුපියල් 100ට ළං විණ. එසේ වුව ද මහජනතාව මෙවර ද අවුරුදු සඳහා සූදානම් වෙමින් සිටයහ. සති අන්ත දිනයන්හි දී නුගේගොඩ, මහරගම නගරයන්හි රැස් කෑ සෙනඟ මෙවර ද එළෙසින් ම වීය.

දේශපාලන කරළියේ මොනයම් අන්දමකින් මෝ මුහුකුරා ගිය ජ්‍යෙෂ්ඨයින් දෙදෙනෙකු වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ අනුර බණ්ඩාරනායක යන මහත්වරුන් ගේ වියෝවයන් කණගාටුදායක සිද්ධීන් වීය. දේශපාලන ලෝකයේ වියෝ වීම් මෙන්ම බෙදී බිඳී යාම් ද රටේ අනාගතයට අහිතකර ලෙසින්ම බලපානවා නොවේද?

විශ්ව කීර්තිධර විද්‍යාඥයෙකු වූ ආතර් සී ක්ලාක් වියතාණන්ගේ වියෝවද හද කම්පාකරවන්නක් වීය අප හට. එපුවත් ඇසූ සැණින් සිහිපත් වූයේ මෙල්බර්න් හි මවුන්ට් වේවර්ලි පුස්තකාලයේ කියවන්නන්ගේ පරිහරණය සඳහා තබා ඇති එතුමාණන්ගේ ඉංග්‍රීසි බසින් ලියැවුණ පොත් පෙළයි.

දිවයින පුරා පැතිර ඇති ශ්‍රව්‍ය, දෘෂ්‍ය, විද්‍යුත් හා පුවත්පත් මාධ්‍යයන්ගේ දියුණුව පිළිබඳවද මෙහිදී සිහිපත් කළයුතු වන්නේය. ගුවන් විදුලි නාලිකා විස්සක් පමණ ඇතැයි අසන්නට ලැබිණ. එකිනෙකා පරදන්නට දඟලන ඔවුන්ගේ තරඟයේ නිසි හා අනිසි පළ එමටයි. ඇතැම් දිනවල ඇතැම් මාර්ගවල නොමිලයේ බස්රථ පවා ධාවනය කරවන බවකි අසන්නට ලැබුණේ. හර බර අංග ප්‍රසංග ද නැතිවා නොවේ.

මේ අතරේ රසිකයින් වෙත පිදෙන හරවත් නිර්මාණද බිහිවන්නේය. පහුගිය වකවානුවේ එළි දැක්වුණ වූ වික්ටර් රත්නායකයන්ගේ "ගැහැණු ළමයිනේ " ගී එකතුවක් සුනිල් එදිරිසිංහයන් ගේ "වාදකයාණනි" ගී එකතුවත් රෝහණ බැද්දගේ ශිල්පියාණන්ගේ "සසඳ" ගී එකතුවත් අවුරුදු සමයේ රසික රසිකාවියන් අමන්දානන්දයට පත්කරවන ගී රසෝඝයක් මවනු ඇත." පන් ලියවිල්ල හමාර කළා.

"නුඹේ සිරික්කියට" නමින් පන්ගේ පද රචනාවලින් කෙරුණ ගීත එකතුවකුත් අප්‍රේල් තුන්වෙනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගරෙයේදී එළිදැක්වුණා. ශාලාව පිරෙන්න ඇවිත් උන්නු රසික රසිකාවියන්, නෑ හිතවතුන් , විද්වතුනන්, කලාකරුවන් පිනවන්න වික්ටර් රත්නායක මහත්තයයි දීපිකා පියදර්ශනී ශිල්පිනියයි සින්දු කිව්වා. ප්‍රනීත් අභයසුනදර මහාචාර්ය තුමා දිග දේශනයක් කළා. සහන් රන්වල තරුණයා රන්වල ජන ගී කණ්ඩායමත් එක්ක අපූරු ප්‍රසාංගික අංග ගණනාවක්ම කළා. උත්සවය මෙහෙයෙව්වේ ප්‍රවීණ ගීත රචක බණ්ඩාර ඇහැළියගොඩ මහත්තයා. සංගීතය ජයන්ත රත්නායක තරුණ ශිල්පියාගෙන්. පන්ට අකුරු කියෙව්ව සාර්ලිස් අමරසිරි ගුරුතුමාත් හැඟීම් බර කතාවක් කළා. සංගීත තැටිය මුලින් ම පිළිගැන්නුනෙ අම්මාට.

"රත්තරං අම්මා බුදු වේවා !" හිත හොඳ පින්ට ආයෙත් කියවුණා.

"අම්මා කෙනෙක් හරියට සෙබළියක් වගෙයි. ජීවිතය ජයගන්න නොකරන හටනක් නෑ....." මෙල්බර්න් නුවර පැවැත්වුණ "සෙබළිය" ප්‍රසංගයේ වේදිකා සැරසිල්ලට ඇඳපු කටු සටහන පින් පන්ට දුන්නා. පන්ගේ ලියවිල්ලට අමුණන්න.

"අම්මා වගේම තමා අපේ ලංකාව කියන අම්මාත්... අපේ අයව තමන් තුරුලෙ රැකගන්න මොන මොන හටන් කරනවාද කියලා පේන්නෙ ලංකාවට ගියාමයි." පන් කිව්වේ බොහෝම හැඟීම්බර හඬකින්.



සිසිර දිසානායක

# සිසිර දිසානායක ගේ

# නුඹෙ සිරික්කියට ගී එකතුව එළි දැක්වීම




පිළිගන්වමින් .....

මෙල්බන් නුවර වෙසෙන ප්‍රවීණ ගීත රචක සිසිර දිසානායක ගේ ගී පද රචනා වලින් යුත් සංගත තැටියක් ''නුඹෙ සිරික්කියට'' නමින් පසුගිය දා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී විහාල රසික හිතවතුන් හා කලාකරුවන්ගෙ පිරිසකගේ සහභාගිත්වයෙන් එළි දක්වන ලදී . මෙහිදී ප්‍රවීණ ගීත රචක බණ්ඩාර ඇහැලියගොඩ මහතා උත්සව සභාව මෙහෙයවූ අතර මහාචාර්ය ප්‍රනීත් අභයසුන්දර මුඛ්‍ය දේශනය ද ගායන ශීල්පී වික්ටර් රත්නායක විශාරද දීපිකා ප්‍රියදර්ශනී ගායනයෙන් ද සහන් රන්වල ප්‍රමුඛ රන්වල ජන ගී කන්ඩායම ප්‍රසංගික රංගනයෙන් හා නර්තනයෙන් ද උත්සව සභාව අලංකාර කළ හ.

නුඹෙ සිරික්කියට සංගත තැටිය ට අනුග්‍රහය දැක්වූයේ සිතාරා ඉන්ටනැෂනල් අධිපති ඩෙන්සිල් ජයවීර මහතා ය.

මෙම සංයුක්ත තැටිය මෙල්බන් නුවරදී එළී දැක්වීමේ උත්සවය ජූලි මස 13 වන දින සිදු කෙරෙන් අතර ඒ පිළිබඳ වැඩි විස්තර ලබන සන්නසින් බලාපොරොත්තුවන්න.